# පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක උපදේශන සේවාව පිළිබඳ ඇගයීමක්

(ගලාවත අධ්‍යාපන කලාපයේ පාසල් ඇසුරින්)

FACULTY OF GRADUATE STUDIES
11 MAR 2015
UNIVERSITY OF KELANIYA

බෝගමුවේ ධීරානන්ද හිමි

ගෞරව ශාස්ත්‍රවේදී (පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (කොළඹ විශ්වවිද්‍යාලය)

පශ්චාත් උපාධි බුද්ධධර්ම ඩිප්ලෝමා (බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය)

**ලියාපදිංචි අංකය : FGS/P/MSSc/2006/01**

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 942 |
| වර්ග අංකය: | |

**කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යාපති උපාධි (දර්ශනය) පාඨමාලාවේ අවශ්‍යතා පූරණය සඳහා ඉදිරිපත් කෙරෙන ස්වාධීන පර්යේෂණ නිබන්ධය**

2012

# පෙරවදන

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක උපදේශන සේවාව පිළිබඳ පර්යේෂණයක් කිරීමට මා පෙළඹවූයේ මා සේවය කළ හලාවත විජයකටුපොත මහා විද්‍යාලයෙනි. එම විද්‍යාලය තුළ එවකට උපදේශන සේවාවක් නොතිබීමත් ශිෂ්‍ය ගැටලු පිළිබඳ ව නිරන්තර ව වාර්තා වීමත් නිසා ඒ පිළිබඳ ව යම් සොයා බැලීමකට යාමට සිත් විය. ඒ වන විට මා කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යාපති උපාධි පාඨමාලාව හදාරමින් සිටි නිසා අදාළ ගැටලුව නිබන්ධයේ මාතෘකාව වශයෙන් ඉදිරිපත් කළ අතර එය අනුමත විය.

උපදේශන ක්‍රියාවලිය පිළිබඳ උඩින් පල්ලෙන් අතපත ගා තිබුණ ද ඒ පිළිබඳ ගැඹුරු දැනුමක් මට නො විය. ඒ වන විට සිංහල බසින් උපදේශනය පිළිබඳ ව ලියවී තිබුණු පොත් කිහිපයක් කියවා තිබූ මා දිනක් නිබන්ධයේ උපදේශක මහාචාර්ය ගාමිණී හපුආරච්චි මහතා හමු විය. එහි දී සිංහල බසින් ලිය වී ඇති පොත් කියවීමට වෙනුවට ඉංග්‍රීසි බසින් උපදේශනය පිළිබඳ ව ලියවී ඇති පොත් කියවන ලෙස මට උපදෙස් ලබා දෙන ලදී. එවැනි ග්‍රන්ථ පහසු මිලකට ගත හැකි වර්ල්ඩ් ලින්ක් ආයතනය පිළිබඳ ව ද විස්තර ලබා දෙන ලදී. සැබැවින් ම එය සත්‍යයක් බවට පත් වූයේ ජාතික පුස්තකාලවල ද සොයා ගැනීමට අපහසු උපදේශනය පිළිබඳ නවතම ග්‍රන්ථ කිහිපයක් මිලට ගැනීමට හැකි වීමයි. එම ග්‍රන්ථ පරිශීලනය කළ මා උපදේශනය පිළිබඳ දැනුම් සම්භාරයක් ලබා ගන්නා ලදී. ඊට අමතර ව ජාතික අධ්‍යාපන ආයතනයේ පුස්තකාලයේ ඉංග්‍රීසි භාෂාවෙන් උපදේශනය පිළිබඳ ව ලියවුණු ග්‍රන්ථ රාශියක් ඇති බැවින් එම ආයතනයට ගොස් ඒවා ද කියවන්නට විය.

මේ වන විට මා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරීවරයෙකු වශයෙන් වර්ෂ 02ක් සඳහා සේවය කිරීමට පැමිණි බැවින් පර්යේෂණය කිරීම තරමක් අඩාල විය. එම නිසා පර්යේෂණයේ කාලය දීර්ඝ කරගැනීමට ද සිදු විය. මෙම කාලය තුළ ඩබ්ලිව්.ජී.එම්. ප්‍රනාන්දු දැඩි ලෙස මා දිරිමත් කරමින් නිබන්ධයේ කටයුතු සාර්ථක ව කරන ලෙස ප්‍රකාශ කරමින් සෑම විටම උපදෙස් දෙන ලදී.

නිබන්ධයේ පරිච්ඡේද එකිනෙක අවසන් කරමින් උපදේශක ගුරුතුමා ට ඒවා පෙන්වමින් අඩුපාඩු සකස් කරමින් පර්යේෂණයේ කටයුතු සිදු කරන ලදී. ඉන්පසු ප්‍රශ්නාවලිය සකස් කර ඒ සඳහා උපදේශක ගුරුතුමාගේ උපදෙස් හා අනුමැතිය ලබා ගෙන පාසල් සඳහා ලබා දෙන ලදී. එම පාසල්වලට ප්‍රශ්නාවලිය රැගෙන ගිය අවස්ථාවේ දී පාසල් තුළ තිබෙන විවිධත්වය මනාකොට දුටුවෙමි. එම පාසල් හරස්කඩ තුළ පාසල් පිරියත, සිසු විනය, ආගන්තුක සත්කාරය සිදුවන්නේ කෙසේ දැයි එහි විශේෂතා මැනවින් අවබෝධ කර ගතිමි.

මෙම පර්යේෂණ නිබන්ධය මේ අයුරින් නිම කිරීමට බොහෝ දෙනෙකුගේ සහයෝගය ලැබුණි. ඒ සියළුදෙනාට ද ස්තූතිය පළ කිරීමට සඳහා මෙය අවස්ථාවක් කර ගනිමි.

පශ්චාත් උපාධි පර්යේෂණකරණයේ යෙදෙන විද්‍යාර්ථීන් නිතර උනන්දුවට ලක් කරමින් කටයුතු කරන දර්ශන අධ්‍යයන අංශයේ අංශාධිපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය දයා එදිරිසිංහ මහතාට මාගේ ගෞරවණීය ස්තූතිය පිරි නමමි.

පර්යේෂණ යෝජනාව අනුමත වූ අවස්ථාවේ සිට උපදේශක ආචාර්යවරයා ලෙස කටයුතු කරමින් නිබන්ධය අවසන් වනතෙක් උපදෙස් දෙමින්, නිබන්ධයේ අඩුපාඩු සකස් කරමින්, දිරිගන්වමින් මා මෙහෙය වූ දර්ශන අධ්‍යයන අංශයේ මහාචාර්ය ගාමිණී හපුආරච්චි මහතා නොවන්නට මෙම නිබන්ධය අතරමග නතර වනු නොඅනුමානය. ගුරුවරයෙකු ලෙසින් සිය කාලය කැප කරමින් අගනා සේවය ලබා දෙමින් එතුමා දැක්වූ අනුපමේය සහය වෙනුවෙන් මගේ ගෞරවණීය ස්තූතිය පුද කරමි.

මා මෙලොවට බිහි කළ චන්ද්‍රසේන පියාණන් සහ නැසීගිය මැණිකේ බොතේජු මැණියන් මේ මොහොතේ සිහිපත් කරමි. මෙවන් පර්යේෂණයක යෙදීමට අවස්ථාව සලසා දුන් මා පැවිදි කළ අපවත් වී වදාළ මයියාවේ ශ්‍රී ආනන්දාභිධාන නාහිමිපාණන් වහන්සේ සහ වර්තමාන මයියාවේ විහාර පරම්පරාවේ අධිපති ආනවිලුන්දාවේ ශ්‍රී පියනන්ද නාහිමිපාණන් වහන්සේලා ට පුණ්‍යානුමෝදනා කරමි.

නිබන්ධයේ කටයුතු අවසන් කර ගැනීම සඳහා අවශ්‍ය වාතාවරණය සලසා දුන් අතුරුගිරිය පුරාණ විහාරයේ විහාරාධිපති පූජ්‍ය ලෙවන්දූවේ චන්දවිමල ලොකු හාමුදුරුවන් වහන්සේට, විහාරාධිකාරී හල්වල ආනන්ද හිමියන් ට හා පොරේගෙදර සිද්ධාර්ථ හිමියන්ට, දඹදෙණිය මුතුගල ශ්‍රී තිලකරත්නාරාම රාජමහා විහාරාධිපති පූජ්‍ය හුණුපොලගම ධම්මරක්ඛිත ලොකු හාමුදුරුවන් වහන්සේට සහ පහළදිවුල්වැවේ නාරද හිමියන්ට, පුණ්‍යානුමෝදනා කරමි.

ප්‍රශ්නාවලි සඳහා නියාමන පර්යේෂණය සිදුකළ ගිරි/දඹදෙණිය මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති ඇතුළු ආචාර්ය මණ්ඩලයටත් විශේෂයෙන් සහයෝගය දුන් එහි උපදේශනය භාර ගුරුතුමියටත් මාගේ ස්තූතිය පිරිනමමි.

පර්යේෂණ නියැදිය සඳහා තෝරාගත් පාසල්වල විදුහල්පතිවරුන්ට, උපදේශනය භාරව අදාළ ප්‍රශ්නාවලිය සඳහා අවශ්‍ය දත්ත ලබාදුන්, කටයුතු කරන ගුරුභවතුන්ට සහ සේවා ගුරුභවතුන්ට විශේෂයෙන් ස්තුතිවන්ත වෙමි.

යොවුන් මිතුරෝ සංවිධානය මගින් එළිදැක්වූ උපදේශන සේවා වාර්තා ඉවත දැමීමට නොදී ආරක්ෂා කරගෙන එම වාර්තා මා වෙත ලබා දෙමින් දැක්වූ සහයෝගය දැක් වූ ජාතික තරුණසේවා සභාවේ උපදේශන අංශයේ කුරුණෑගල දිස්ත්‍රික්කය භාර උපදේශිකා ටී. ගුණවර්ධන මහත්මිය ට ස්තුති විය යුතුය.

අවශ්‍ය පත පොත සපයා දෙමින් සහයෝගය දැක්වූ ජාතික අධ්‍යාපන ආයතනයේ පුස්තකාලයාධිපති ඇතුළු කාර්යමණ්ඩලයට ද ස්තුතිය පුද කරමි.

මෙම නිබන්ධයේ සෝදුපත් බැලීමෙන් සහයෝගය ලබාදුන් මාගේ කල්‍යාණ මිත්‍ර ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති නිලධාරී පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමියන් ද භක්තියෙන් යුතුව සිහිපත් කරමි.

නිබන්ධය පරිගණක ගත කර දුන් විජේරාම කෝකිල ග්‍රැෆික්ස් ආයතනයේ කාර්ය මණ්ඩලයට ද සහයෝගය දුන් සැමට ද ස්තුතිවන්ත වෙමි.

බෝගමුවේ ධීරානන්ද හිමි